සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 07 - 2023

## සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I - කොටස

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- අංක 1 සහ 2 ප්‍රශ්නවල ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

01. ජීවිතය ජයගන්නට වෙර දරන අයට <u>අත දීම</u> හොඳ පුරුද්දක් වග ගුරුතුමිය පැවසුවා ය.
    i. මිල මුදල් දීම   ii. උදව් කිරීම   iii. අගය කිරීම   iv. ප්‍රශංසා කිරීම

02. ඔහු <u>පිහිටක් අපේක්ෂා කළ ද සිදුවූයේ විපත්තියකට මුහුණ දීමට</u> ය.
    i. වක්කඩේ හකුරු හැංගුවා වගේ.
    ii. නැග්ග ඉනිමගට පයින් ගහනවා වගේ.
    iii. වඳින්න ගිය දේවාලෙ හිසේ කඩා වැටුණා වගේ.
    iv. කන්න දුන්න අත හපා කනවා වගේ

03. පහත වචනවල මහාප්‍රාණ අක්ෂරයක් නොමැති වචනය වන්නේ,
    i. කනිෂ්ඨ   ii. විශේෂ   iii. දුර්භික්ෂ   iv. සජ්ඣායනා

04. පහත i හා ii ප්‍රශ්නවල වැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරා යටින් ඉරක් අඳින්න.
    i. භාන්ඩය, ප්‍රශ්නය, සමීක්ෂණය, ප්‍රතිඵල
    ii. නිර්මාණය, සංවිධානය, සෞභාග්‍යය, වාර්ථාව

05. ප්‍රථම පුරුෂ බහු වචන අනුක්ත නාම පදය වන්නේ,
    i. තොප   ii. අප   iii. ඔවුන්   iv. මිනිස්සු

06. මධ්‍යම පුරුෂ අතීත කාල ඒක වචන ආඛ්‍යාතය වන්නේ,
    i. ගියාය   ii. ගියෙහි   iii. ගියේය   iv. ගියෙහු

07. ''ලංකා ලංකා පෙම්බර ලංකා....'' ගීතයේ රචකයා
    i. ඩෝල්ටන් අල්විස් මහතා   ii. අරිසෙන් අහුබුදු මහතා
    iii. මහගමසේකර මහතා   iv. මඩවල එස්. රත්නායක මහතා

08. පහත වාක්‍යාංශයට ගැළපෙන තනි පදය ලියන්න.
    i. කිසිවෙකුට සම කළ නොහැකි -
    ii. ජනයා බහුල ව වාසය කරන -

09. වරහන් තුළින් ගැළපෙන පදය තෝරා හිස්තැනෙහි ලියන්න.
    - පාසල් යාමට සූදානම් ව ඇඟිලි......................මල්ලී දුටු තාත්තා හොඳට ම .......................... වී ඔහුට තරවටු කළේ ය. (උරන/ උරණ)

10. පහත වචනවලට උචිත විරුද්ධාර්ථ පද ලියන්න.
   i. ආවරණය -
   ii. භය -

11. පහත වචනවලට උචිත සමානාර්ථ පදය බැගින් ලියා දක්වන්න.
   i. රත්තරන් -
   ii. මුහුණ -

12. කමත් භාෂාවේ කුඹල් ගෙඩිය යන වචනය සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන පදය තෝරන්න.
   i. කළය   ii. පුවක් ගෙඩිය   iii. විශාල පෙට්ටිය   iv. බිස්ස

13. අභිකුණ්ඨික භාෂා ව්‍යවහාරයේ එන ''අබ්බඩා'' යනු
   i. අයියා   ii. ආතා   iii. පියා   iv. මව

14. උපසර්ග පදයක් <u>නොවන</u> පදය තෝරා යටින් ඉරක් අඳින්න.
   i. නිදොස්   ii. පරසිඳු   iii. හීනමානය   iv. නිශ්චල

● **හිස්තැනට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා සම්පූර්ණ කරන්න.**

15. මම ......................... අඬහැර පාමින් සීසාන ආකාරය දෙස ආසාවෙන් බලා සිටියෙමි.
   (ගොවීන් / ගොවියෝ / ගොවීහු)

16. ......................... දුනු ඊතල රැගෙන බල්ලන් සමග දඩයම සඳහා පිටත් වෙයි.
   (වැද්දා / වැද්දෙකු / වැද්දියක)

17. පාපිල්ල පමණක් යෙදුණු වචනය වන්නේ,
   i. කුරිරු   ii. රුදුරු   iii. රැඳුණු   iv. රැකුණු

18. පහත වාක්‍යයෙහි ඇති විශේෂණ පද දෙකක් තෝරා ලියන්න.
   ● ක්‍රියාශීලි තරුණයා සුන්දර ගෙවත්තක් නිර්මාණය කිරීමට යුහුසුළු ව වැඩ කළේ ය
   i. ...........................................   ii. ...........................................

19. සුදුසු ආඛ්‍යාත පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.
   i. වඩු කුරුල්ලා කුරුලු ලොවේ ලස්සන ම නිවහන .......................... (තනයි / තැනුවාය / තනති)
   ii. තුරුපෙළ මහ සුළඟින් කඩා .......................... (වැටුණෝය / වැටුණාය / වැටුණි)

20. පහත සඳහන් වාක්‍යය නිවැරදි ව පද බෙදා නැවත ලියන්න.
   ● සිරි පාව දින්නට යනග මනේදී අසන් නට ලැබෙ නව චනයක් ලෙසකෝ ඩුකාර යාහැදින් වියහැ කිය.
   .....................................................................................................................................
   .....................................................................................................................................
   .....................................................................................................................................

(ලකුණු 2 × 20 = 40)

## II - කොටස

- **පළමු, දෙවන හා තෙවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **වෙන ම කොළ භාවිත කරන්න.**

---

(01) මෙම ප්‍රශ්නයේ සියලු ම කොටස්වලට පිළිතුරු සපයන්න.

1. පහත වචන යොදා ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය නිර්මාණය කරන්න.
   i. අගල -
   ii. අඟල -

2. පහත කෘතිවල නිර්මාණකරුවන් නම් කරන්න.
   i. විකෘති නාට්‍යය -
   ii. ලෝකෝපකාරය -

3. පහත වචනවල අරුත් ලියන්න.
   i. අනර්ඝ -
   ii. ආශ්චර්යය -
   iii. නිග්‍රහ -
   iv. ප්‍රවීණ -

4. සිංහල අක්ෂර මාලාවේ ඇති ''ෆ'' අක්ෂරය යෙදෙන වචන 2ක් ලියන්න.
   i. ..................................
   ii. ..................................

5. පහත සඳහන් කවිය සඳහා ගැළපෙන පද දෙකක් ඔබේ කවි හැකියාව භාවිත කර ලියන්න.

   කුරුලු පැටියෝ ඔයා ඔතන මොකද   කරන්නේ
   අපේ කිරී ගහ පාමුල රැකගෙන   ඉන්නේ
   .........................................................................................
   .........................................................................................

(ලකුණු 2 × 5 = 10)

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

1. හොඳ සිරිත් පුරුදු වෙමු
2. මා ගිය අධ්‍යාපන චාරිකාව
3. උපන් බිමට ආදරය කරමු
4. නිවැරදි ව තාක්ෂණය භාවිතයෙන් අධ්‍යාපනය ජයගනිමු
5. සුන්දර දිය ඇල්ලක් අසල පිරිසක් සිරි නරඹමින් සිටිති. හදිසියේ ම ළමයෙකු කෑ ගසන හඬක් ඇසුණි. ඒ සමග ම ශබ්දය ආ දෙසට සියල්ලෝ ම දිව ගියහ. .............................. එතැන් සිට ඉදිරියට කතාව ගොතන්න.

(ලකුණු 20)

(03) ඔබ ඔබේ පාසලේ රිය නියාමක සංසදයේ ලේකම් යයි සිතන්න. ඔබේ පාසල ඉදිරිපිට මාර්ගයේ පාසල ආරම්භ කරන හා අවසන් වෙලාවට ඇති මාර්ග අවහිරතාව අවම කර ගැනීමට කුරුණෑගල පොලිස් රථවාහන අංශයේ නියාමකවරයෙකුගේ සහය ඉල්ලා එහි ස්ථානාධිපතිවරයාට ලියන රාජකාරි ලිපිය ලියන්න.

(ලකුණු 10)

(04) පහත ප්‍රකාශ ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.

1. ''අලුත් දැනුම ලබා ගැනීමටත් දැනුම ගවේෂණය කිරීමටත් විමසා බලා තීරණය කිරීමටත් අවබෝධයක් ලැබුවා....''
2. ''අනේ කමක් නෑ හාමිනේ පුංචි අයගේ ආසාව නේ....''
3. ''යමුද ඉස්සරහට...? මෙතන සෙනඟ පිරිලනේ....''
4. ඇයි තොපා කුමට අවු ද?
5. ''ඒක ලී වලින් හදපු එකක් නේද?...''

| පාඩමේ නම (1) | කීවේ කවු ද? ( 1/2 ) | කාහට ද? ( 1/2 ) |
|---|---|---|
| 1<br>2<br>3<br>4<br>5 | | |

(ලකුණු 2 × 5 = 10)

(05) 1. පහත වාක්‍ය බහුවචනයට හරවා ලියන්න.

i. ඈ මිහිරි ගීතයක් ගයයි.
ii. මම නොබෝ දිනකින් විදෙස්ගත වෙමි.
iii. නුඹ මඩොල් දූව කියවා ඇත්තෙහි.
iv. මිනිසා පොරොවෙන් ගස කපා ගිමන් හැරියේ ය.
v. ගෙවිලිය ඇඹුල රැගෙන කමතට පිය නැගුවා ය.

(ලකුණු 1 × 5 = 5)

2. පහත වාක්‍යවල හිස් තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

i. ..................... (මම / මා / අපි) ඔවුන් පැමිණෙන තුරු බලා සිටිමි.
ii. ඕ තොමෝ දරුවන්ට උපදෙස් ...................... (දුන්නෝය / දුන්නාය / දුන්නේය).
iii. වෙළෙන්දෝ ........................... (පාරිභෝගිකයෙක් / පාරිභෝගිකයෝ / පාරිභෝගිකයන්) රවටා බඩු විකිණූහ.
iv. නුඹලා දානමය පිංකම සඳහා අප නිවසට ..................... (පැමිණියහ / පැමිණියෙහු / පැමිණියෙහි).
v. ගුරුතුමිය ............................ (සිසුවියක් / සිසුවියෝ / සිසුවියක) සැනසුවා ය.

(06) පහත සඳහන් කවිවල ඉරි ඇඳි පද අයත් කාව්‍ය උපක්‍රමය ඉදිරියෙන් ලියන්න.

1. <u>දිලිහි දිලිහි</u> ආකාසේ
බබළන මල් තාරුකා ...... (..............................)

2. <u>වත සුපිපි පියුමෙකි</u>
නෙත සුනිල් මිණි යුවළෙකි ...... (..............................)

3. හා හා හරි <u>හාවා</u>
කැලේ මැදින් <u>ආවා</u>
හිටගෙන ගඟ <u>ගාවා</u>
වට පිට ඇහැ <u>ලෑවා</u> (..............................)

4. ඉරුගේ පොඩි පැටවුන් මෙන්
   බබළන රන්වන් මල් ඇති (...............................)

5. පහත කවිය උපුටාගත් කෘතිය නම් කරන්න.

   ''මගෙ තුන් මැසි දියණිගේ
   රසවත් සිහිනය දිගේ
   සිනා කුමරි නටන කලට
   දිටිමි සියලු රුව ඇගේ....'' (...............................)

(ලකුණු 2 × 5 = 10)

(07) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිංහල ජාතක පොත පාලි ජාතකට්ඨ කථාව ඇසුරින් ලියන ලද්දකි. මෙම ජාතක කතාවලින් බෝධිසත්වයන් වහන්සේගේ අතීත ආත්මභාවයන් සම්බන්ධ කතා කියවේ. ජාතක පොතෙහි කතා ශ්‍රැති ගෝචර ශෛලියෙන් කියවිය හැකි ලෙස ලිය වී ඇත. ජාතක පොත කියවීමෙන් හා කියවනු අසා සිටීමෙන් ධර්මය පිළිබඳවත් ජීවිතය පිළිබඳවත් අගනා වූ දැනුම් සම්භාරයක් අපේ පැරැන්නන් අත්පත් කරගෙන ඇත. ජාතක කතාවලට අපේ රටේ වැසියන් කෙතරම් ගෞරව සැලකිලි දැක්වූවා ද කිවහොත් මෙම මහා අනර්ඝ ග්‍රන්ථය ''ජාතක කතා පොත් වහන්සේ'' යන ගෞරව නාමයෙන් හැඳින්වීමෙන් ම පෙනේ. කුරුණෑගල යුගයේ රජකළ iv වන පරාක්‍රමබාහු රජුගේ දේව ප්‍රතිරාජ ඇමතිවරයාගේ උත්සහය නිසා ලේඛක පර්ෂදයක් විසින් රචනා කරන ලද ජාතක පොතෙහි මුල්ම ජාතකය අපණ්ණක ජාතකයයි. ජාතක පොතේ දිගම ජාතක කතාව උම්මග්ග ජාතකයයි. මෙම ජාතක කතාවේ සඳහන් ආකාරයට ම මහෞෂධ පඬිතුමා ඉතා විශාල යුධ සේනාවක් පරාද කොට ජයග්‍රහණය ලබා ගත්තේ කිසිවෙකුගේ ඇගේ එකදු ලේ බිඳුවකුදු නොසොල්වමිනි.

1. සිංහල ජාතක පොත ලියා ඇත්තේ කුමක් ඇසුරින් ද?
2. i. ජාතක පොතෙහි කතා ලිය වී ඇත්තේ කුමන ශෛලියෙන් ද?
   ii. ජාතක පොත ලිය වී ඇත්තේ කුමන රජතුමාගේ කාලයේ ද?
3. සඤ්ඤක අක්ෂර යෙදුණු වචනයක් සහ මහාප්‍රාණ අක්ෂර සහිත වචනයක් ලියන්න.
4. ඡේදයේ සඳහන් ජාතක කතා දෙකක නම් ලියන්න.
5. මහෞෂධ පඬිතුමා විශාල යුද සේනාවක් පරදා ජයග්‍රහණය ලබා ගත්තේ කුමන ආකාරයට ද?

(ලකුණු 2 × 5 = 10)